# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2192/5 - 2020 සැප්තැම්බර් මස 07 වැනි සඳුදා - 2020.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාවේ අංක 02 - හේවාදිවෙල කොට්ඨාසයට තේරී පත්වූ පෙරුම්බඩගේ මංජුල බෝගහවත්ත අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කරගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම රඹුක්කන ප්‍රාදේශීය සභාවේ අංක 02 - හේවාදිවෙල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා හේරත් ගෙදර ලයනල් සරත් කුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, සජිත් වසන්ත වෙල්ගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, හේරත් ගෙදර ලයනල් සරත් කුමාර, රඹුක්කන ප්‍රාදේශීය සභාවේ අංක 02 - හේවාදිවෙල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**සජිත් වසන්ත වෙල්ගම,**
තේරීම්භාර නිලධාරී,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2020 සැප්තැම්බර් මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

9 - 487


1A - G 32813 — 30 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*